**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය**

# විශ්වවිද්‍යාල ප්‍රවේශය

# ශාස්ත්‍රවේදී (ගෞරව) ත්‍රිපිටක අධ්‍යයන උපාධි පාඨමාලාව

## 2022/2023 අධ්‍යයන වර්ෂය

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, බුදුන් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුකූලව ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම, බෞද්ධ භාවනාව පිළිබඳ පුහුණු කිරීම හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම, ථෙරවාද බුද්ධ ධර්මය ශ්‍රී ලංකාවේ හා විදේශීය රටවල ප්‍රචාරය කිරීමට භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම, තුලනාත්මක සමය අධ්‍යයනය, බුද්ධ ධර්මය පිළිබඳ පර්යේෂණ කිරීමට ධෛර්යය දීම යනාදී පරමාර්ථ ඉටු කර ගැනීමේ අරමුණින් සංස්ථාපනය කරන ලද උසස් අධ්‍යාපන ආයතනයකි.

මෙම විශ්වවිද්‍යාලය මගින් 2024 වර්ෂයේ සිට ශාස්ත්‍රවේදී (ගෞරව) ත්‍රිපිටක අධ්‍යයන නමින් නව උපාධි පාඨමාලාවක් හඳුන්වාදෙනු ලැබේ.

- ශාස්ත්‍රවේදී (ගෞරව) ත්‍රිපිටක අධ්‍යයන උපාධි පාඨමාලාව (SLQF Level 6) - වසර 04

**<u>බඳවාගනු ලබන ආකාරය :-</u>**

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී (ගෞරව) ත්‍රිපිටක අධ්‍යයන උපාධි පාඨමාලාව 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා පහත දැක්වෙන සුදුසුකම් සපුරා ඇති බෞද්ධ භික්ෂූන් වහන්සේලාගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**<u>ප්‍රවේශ සුදුසුකම්</u>**

| | | |
|---|---|---|
| 01. | • බෞද්ධ විහාර දේවාලගම් පනතේ නියමයන්ට අනුකූලව ලියාපදිංචි වූ භික්ෂූන් වහන්සේ නමක් වීම. (විදේශීය සිසුන් සඳහා මෙය අදාළ නොවේ)<br>• අපේක්ෂකයා ඉල්ලුම් පත්‍ර යොමු කරන දිනට වයස් සීමාව අවුරුදු 18 ට නො අඩු විය යුතු ය. | |
| | | **හා** |
| 02. | i) | ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් පවත්වනු ලබන ප්‍රාචීන ප්‍රාරම්භ හෝ ඉන් ඉහළ විභාගයක් සමත් වී තිබීම. |
| | | **හෝ** |
| | ii) | ඕනෑම විෂය ධාරාවක් යටතේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම හා සාමාන්‍ය පොදු පරීක්ෂණයේ දී 30 % කට නො අඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබීම. |
| | | **හෝ** |
| | iii) | බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ටාචාරය, පාලි, සංස්කෘත හෝ බෞද්ධ අධ්‍යයන විෂයයන් යටතේ SLQF 03 සහ 04/ NVQ 05 සහ 06 ස්තරවලට අදාළ සුදුසුකම් සපුරා තිබීම. |
| | | **හෝ** |
| | iv) | ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගන්නා වෙනත් සුදුසුකමක් සපුරා තිබීම. |

- මෙම උපාධි පාඨමාලාවට ප්‍රවේශ පරීක්ෂණයක් මගින් සිසුන් ඇතුළත් කරගන්නා බැවින් අයදුම්කරුවන් විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ප්‍රවේශ පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය. ප්‍රාචීන මධ්‍යම හා අවසාන විභාග සමත් සිසුන් ප්‍රවේශ පරීක්ෂණයෙන් නිදහස් වේ.

**අයදුම්පත් ලබා ගැනීම හා යොමු කිරීම.**

www.busl.ac.lk විශ්වවිද්‍යාලයීය නිල වෙබ් අඩවියෙන් බා ගත කරගනු ලැබූ අයදුම්පත නිසිපරිදි සම්පූර්ණ කොට අදාළ ලේඛනවල සහතික කළ පිටපත් හා අනුරාධපුර මහජන බැංකුවේ 008-1001-5001-4462 අංක දරන ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයීය පුනරාවර්තන ගිණුමට රු.200.00 මුදලක් බැරකර ලබාගත් ලදුපත ද සමග **2024.02.29** දින හෝ එදිනට පෙර ලැබෙන සේ **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි (අධ්‍යයන හා ශිෂ්‍ය සේවා), ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුරය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ශීඝ්‍රගාමී තැපැල් (Courier service) මගින් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ශාස්ත්‍රවේදී (ගෞරව) ත්‍රිපිටක අධ්‍යයන උපාධි පාඨමාලා ප්‍රවේශය - 2022/2023"** යනුවෙන් සඳහන් කළ යුතුය. පාඨමාලා විස්තර, ප්‍රවේශ විභාගය පැවැත්වෙන ආකාරය සහ විෂය නිර්දේශ විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් ලබාගත හැකි ය.

**අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**වැඩි විස්තර සඳහා** 025-2236760/ 025-2235328

**මහෝපාධ්‍යායයන් වහන්සේ,**
**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,**
**අනුරාධපුරය.**
2024.01.28